සැ. යු.-2010.06.04 දින පළ කරන ලද 1,657 දරන ගැසට් පත්‍රයේ II සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,658 - 2010 ජූනි මස 11 වැනි සිකුරාදා - 2010.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | පළාත් සභා නිවේදන ... ... ... ... | 1212 |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | -- | පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | -- |
| | | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීත් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූනි මස 18 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජූනි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# පළාත් සභා නිවේදන

## වයඹ පළාතේ පළාත් සභාව

වයඹ පළාතේ පළාත් සභාවේ 2009 අංක 04 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) සංශෝධන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2010.05.04 වැනි දින සම්මත කරන ලදුව, 2010.05.06 වැනි දින වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළ කරමි.

එස්. ආර්. ඒ. සමරකෝන්,
ලේකම්,
වයඹ පළාතේ පළාත් සභාව.

2010ක් වූ මැයි මස 11 වැනි දින,
කුරුණෑගල වයඹ පළාතේ පළාත් සභාවේ,
සභා කාර්යාලයේ දී ය.

**2009 අංක 04 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) (සංශෝධන) ප්‍රඥප්තිය**

2000 අංක 3, 2001 අංක 2, 2002 අංක 03, 2004 අංක 4 සහ 2006 අංක 01 දරන ප්‍රඥප්තිවලින් සංශෝධිත වයඹ පළාතේ පළාත් සභාවේ 1989 අංක 3 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :–

ලුහුඬු නාමය.

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2009 අංක 04 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 2(ඉ) හා 2(ඊ) උපවගන්ති සංශෝධනය කිරීම.

2. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 2(ඉ) උපවගන්තියේ සඳහන් "රුපියල් දස දහසක්" යන පාඨය ඉවත් කොට ඒ වෙනුවට "වයඹ පළාත් අමාත්‍ය මණ්ඩලය අනුමත කර වයඹ පළාත් ආණ්ඩුකාරවරයා නියම කරනු ලබන දීමනාවක්" යන පාඨය ඇතුළත් කිරීමෙන් ද,

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 2(ඊ) උපවගන්තියේ සඳහන් "රුපියල් හත්දහස් පන්සීයක්" යන පාඨය ඉවත් කොට ඒ වෙනුවට "වයඹ පළාත් අමාත්‍ය මණ්ඩලය අනුමත කර" වයඹ පළාත් ආණ්ඩුකාරවරයා නියම කරනු ලබන දීමනාවක්" යන පාඨය ඇතුළත් කිරීමෙන්ද, සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවයක් වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

06-156

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.